# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | HRC/AM/54/20/S/EM<br>HRC/AM/28/19/S/EM | දිනය<br>திகதி<br>Date | 2022.01.28 |
|---|---|---|---|---|

පැමිණිලි පාර්ශවය : කේ.ඩී.එම්.ආරියලතා පොඩිමැණිකේ මිය,
අංක : 61, මහජන පුස්තකාලය අසල,
මහවැලි නිවාස, දෙහිඅත්තකණ්ඩිය.

වගඋත්තර පාර්ශවය : 01. ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
නැගෙනහිර පළාත,
ත්‍රිකුණාමලය.

02. ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත,
ත්‍රිකුණාමලය.

03. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
අම්පාර.

04. වෛද්‍ය අධිකාරි,
මූලික රෝහල,
දෙහිඅත්තකණ්ඩිය.

පැමිණිලි අංක : **HRC/AM/54/20/S/EM, HRC/AM/28/19/S/EM**

**පැමිණිල්ලේ කරුණු :**

ඉහත පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත HRC/AM/28/19/S/EM දරණ පැමිණිල්ල ගොනු කරමින් කියාසිටින්නේ, තමා දෙහිඅත්තකණ්ඩිය මූලික රෝහලේ ආහාර නිරීක්ෂිකාවක ලෙස සේවය කරමින් සිටියදී 2016.02.17 දින රෝහලේ වෛද්‍ය අධිකාරි විසින් සිදුකරන ලද හදිසි පරීක්ෂාවකදී මුළුතැන්ගෙයට අවශ්‍ය අමු ආහාර ද්‍රව්‍ය ප්‍රමාණයක් මුළුතැන්ගෙයි සේවය කරන සේවකයින්ගේ විවේක කාමරයේ යම් යම් ස්ථාන වල තිබී සොයා ගන්නා ලද බවත්, ඒ අනුව තමා ඇතුළු මුළුතැන්ගෙයි සේවය කරන 05 දෙනෙකුට චෝදනා එල්ල කල බවත්, නමුත් එම අයගෙන් එක් අයෙකු වන බාල මහත්තයා නැමති අයගේ අත් බෑගයේ තිබී අමු ආහාර ද්‍රව්‍ය හමු වී තිබියදී ද ඔහුව පරීක්ෂණ වලින් ඉවත් කර අනෙක් 04 දෙනා සම්බන්ධව පමණක් පරීක්ෂණ කටයුතු සිදුකර තමාට පමණක් දඩුවම් ලබාදීම සිදුකළ බවත්, ප්‍රේමලතා නැමති අයගේ ගමන් බෑගයේ ද තිබී අමු ආහාර ද්‍රව්‍ය අසු වුවද, උසස්වීම් 02 ක් සමඟ වැටුප්


| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541 / 74 |
| | | | | ඊමේල්<br>மின்னஞ்சல்<br>E-mail | sechrc@gmail.com |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 / 82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 |
| | | | | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

වර්ධක ලබාදී ස්ථාන මාරුව ද අවලංගු කළ බවත්, නමුත් තමාට දඩුවම් ලෙස වැටුප් වර්ධක අත්හිටුවා පදියතලාව රෝහල වෙත ස්ථාන මාරු කළ බවත්, ඒ අනුව තමාට සිදුකළ මෙම අසාධාරණය පිළිබඳව පැමිණිලි කිරීම සඳහා ගිය සෑම අවස්ථාවකදීම පළවන වගඋත්තර පාර්ශවය විසින් තමාට බැණ වැදී එළවා ගත් බවත්ය.

තවද, පැමිණිලිකාරිය නැවත 2020.08.14 දින HRC/AM/54/20/S/EM දරණ පැමිණිල්ල කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ, ඉහත දක්වා ඇති පැමිණිල්ලේ සඳහන් අසාධාරණය සිදුවී තමා විසින් වසර තුනක කාලයක් දඩුවම් විඳ තිබියදී තමාගේ ස්ථාන මාරුව අවලංගු කරන ලෙස 2020 වර්ෂයේදී නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරිය වෙත සිදු කරන ලද ඉල්ලීම අනුව 03 වන වගඋත්තරකාර අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් එම ස්ථාන මාරුව අවලංගු කල බවත්, නමුත් වෛද්‍ය නිලධාරි සංගමයේ බලපෑම් මත එය නැවත අවලංගු කළ බවත්, එමගින් විශ්‍රාම යාමට ආසන්න වයසේ පසුවන තමාගේ මූලික අයිතිවාසිකම් දිගින් දිගටම උල්ලංඝනය වන බවත්ය.

**වගඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු :**

- **පළවන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :**

පළවන වන වගඋත්තරකාර නැගෙනහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් පැමිණිල්ලට අදාළව 2019.03.25 දිනැතිව කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ, දෙහිඅත්තකණ්ඩිය රෝහලේ සේවය කළ කේ.ඩී.එම්.ආරියලතා පොඩිමැණිකේ යන පැමිණිලිකාරිය ඇතුළු සිව් දෙනෙකු විසින් රාජ්‍ය දේපළ අයථා පරිහරණය කිරීමක් සම්බන්ධව දෙහිඅත්තකණ්ඩිය මූලික රෝහලේ වෛද්‍ය අධිකාරි විසින් අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත විධිමත් පරීක්ෂණයක් සිදුකරන ලෙසට දැනුම් දී ඇති බවත්, ඒ අනුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් මූලික පරීක්ෂණයක් සිදු කල බවත්, පසුව සිදුකරන ලද විධිමත් විනය පරීක්ෂණය අනුව පැමිණිලිකාරිය පදියතලාව මූලික රෝහල වෙත ස්ථාන මාරු කළ බවත්ය.

අනතුරුව ඒ පිළිබඳව පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කරන ලද අභියාචනය තමා විසින් නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත යොමු කළ බවත්, නැවත පැමිණිලිකාරිය විසින් නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරිය වෙත සිදුකරන ලද අභියාචනය තමා වෙත යොමු කිරීමෙන් අනතුරුව එය ද තමා විසින් නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත යොමු කළ බවත්ය.

පැමිණිලිකාරිය වෙත වැටුප් වර්ධක ලබාදීම සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කර නිකුත් කරන ලද චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ඉල්ලා ඇති බවත්, පැමිණිලිකාරිය සඳහන් කරන ආකාරයේ කිසිදු බැණ වැදීමක් සිදු නොකල බවත් වැඩිදුරටත් කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත.

- **තුන්වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :**

තුන්වන වගඋත්තරකාර අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක විසින් 2020.09.14 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින් සඳහන් කර සිටින්නේ, ආහාර නිරීක්ෂිකාවක ලෙස සේවය කරන ඉහත පැමිණිලිකාරිය විනය හේතු මත නැගෙනහිර පළාත් සෞඛ්‍ය ලේකම්ගේ නියෝග අනුව පදියතලාව ප්‍රාදේශීය රෝහල වෙත ස්ථාන මාරු කරන ලද බවත්, 2017 වර්ෂයට අදාළව ඇයගේ වැටුප් වර්ධකය අත්හිටවූ බවත්ය.

පසුව නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරියගේ දැනුම්දීම අනුව නැගෙනහිර පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ 2020.07.29 දිනැති ලිපියේ නියෝග මත නැවත පැමිණිලිකාරියව දෙහිඅත්තකණ්ඩිය මූලික රෝහල වෙත ස්ථාන මාරු කරන ලද බවත්, නමුත් දෙහිඅත්තකණ්ඩිය මූලික රෝහලේ වෛද්‍ය නිලධාරි සංගමය 2020.08.01 දිනැතිව ලිපියක් යොමු කරමින් මෙම ස්ථාන මාරුව ක්‍රියාත්මක කළහොත් සංගමය වෘත්තීය ක්‍රියාමාර්ගයක් ගන්නා බව දන්වා සිටි බවත්, ඒ අනුව ගැටුම්කාරි තත්ත්වයක් මතුවිය හැකි බැවින්, එම ස්ථාන මාරුව අවලංගු කර නැවත පදියතලාව ප්‍රාදේශීය රෝහල වෙත පැමිණිලිකාරියව ස්ථාන මාරු කළ බවත්, මේ පිළිබඳව නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතින් උපදෙස් ඉල්ලීමේදී ඔහුගේ 2020.08.11 දිනැති ලිපිය මඟින් විනය නියෝගයක් මඟින් කර ඇති ස්ථාන මාරුවීමක් වෙනස් කිරීමේදී විනය බලධාරියාගේ උපදෙස් ලබාගත යුතු බව දන්වා ඇති බවත්, පැමිණිලිකාරියගේ ආහාර නිරීක්ෂිකා පත්වීම් ලිපිය අනුව තුන්වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී නොමැති බවත්, එමෙන්ම නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය නොපැවැත්වීම මත මධ්‍යම රජයේ පොදු චක්‍රලේඛ 02 - 90/2015 - 2 මඟින් සහන ලබාගැනීමට පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතින් කරන ලද උපදෙස් ඉල්ලීමට අනුව කොළඹ සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීමට අයදුම්පත් කැඳවා ඇති බැවින්, ඒ සඳහා ඉල්ලුම් කරන ලෙස පැමිණිලිකාරියට දන්වා ඇති බවත්ය.

තවද, පැමිණිලිකාරිය වෙත ලබාදී ඇති ස්ථාන මාරුව විනය නියෝගයක් මත ලබාදී ඇති ස්ථාන මාරුවක් බැවින්, විනය බලධාරියාගේ උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කිරීමටත් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ පසුව වැටුප් වර්ධක ලබාදීමටත් හා ශ්‍රේණි උසස්වීම් ලබාදීමේ ක්‍රමවේදයෙන් පසු උසස්වීම් ලබාදීමටත් කටයුතු කරන බවත් වැඩිදුරටත් සඳහන් කර සිටී.

- හතරවන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :

2020.09.07 දිනැතිව දෙහිඅත්තකණ්ඩිය මූලික රෝහලේ වෛද්‍ය අධිකාරි විසින් කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ, පැමිණිලිකාරිය 2020.07.31 දින නැවත දෙහිඅත්තකණ්ඩිය මූලික රෝහලේ සේවයට වාර්තා කල බවත්, ඒ අනුව ඇයට තමා විසින් රාජකාරි පැවරූ බවත්, නමුත් එදිනම රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ දෙහිඅත්තකණ්ඩිය මූලික රෝහලේ ශාඛා සමිතියේ සභාපති හා ලේකම්ගේ අත්සනින් රෝහලේ වෛද්‍ය අධිකාරි මඟින් අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත පැමිණිලිකාරිය වන ආරියලතා මහත්මිය නැවත එම රෝහලේ සේවයට වාර්තා කිරීමට විරෝධය පළ කරමින් ලිපියක් භාරදීමත් සමඟ ඒ පිළිබඳව තමා 2020.08.02 දිනැති ලිපිය මඟින් අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත දැනුම් දෙන ලද බවත්, පසුව ඔහු විසින් 2020.08.07 දිනැතිව පැමිණිලිකාර ආරියලතා පොඩිමැණිකේ මහත්මියව නැවත පදියතලාව ප්‍රාදේශීය රෝහල වෙත ස්ථාන මාරු කරන ලද බවත්ය.

- දෙවන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :

02 වන වගඋත්තර පාර්ශවීය නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් 2019.06.11 දිනැති ලිපිය මගින් කොමිෂන් සභාව වෙත දන්වා සිටින්නේ, පැමිණිලිකාරියගේ අභියාචනය 2019.05.30 දින නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ බවත්, නමුත් එම අභියාචනය ප්‍රතික්ෂේප කර පැමිණිලිකාරිය වෙත නිකුත් කළ විනය නියෝගය තහවුරු කළ බවත්ය.

වගඋත්තරකරු විසින් නැවත 2021.04.28 දිනැතිව වාර්තාවක් ඉදිරිපත් කරමින් වැඩිදුරටත් දන්වා සිටින්නේ, පැමිණිලිකාරිය ඇතුළු නිලධාරින් කිහිපදෙනෙකු විසින් රෝහලේ අමු ආහාර ද්‍රව්‍ය සාවද්‍ය ලෙස පරිහරණය කිරීමේ චෝදනාව මත ඔවුන් සියළු දෙනා වෙතම වෙන වෙනම

චෝදනා පත්‍ර නිකුත් කර විනය නියෝග පැනවීමට සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් කටයුතු කර තිබූ බවත්, පැමිණිලිකාරිය විසින් එම විනය නියෝගයට එරෙහිව ඉදිරිපත් කර තිබූ අභියාචනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරන විනය නියෝගය තහවුරු කල බවත්ය. අභියාචනයේ සඳහන් පරිදි පැමිණිලිකාරිය සමඟ වැරදිකරුවන් වූ අනෙක් නිලධාරින්ගේ දඩුවම් ඉවත් කර මෙම නිලධාරිනියට පමණක් තවදුරටත් දඩුවම් ලබාදීම සම්බන්ධව නැගෙනහිර පළාත් සෞඛ්‍ය ලේකම් හා නැගෙනහිර පළාතේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතින් විමසීම් කළ යුතු බවත්ය.

**පැමිණිල්ලේ විරෝධතා :**

පළවන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති වාර්තාව සඳහා පැමිණිලි පාර්ශවය විසින් විරෝධතා ඉදිරිපත් කර ඇති අතර එහි දක්වා සිටින්නේ, රාජ්‍ය දේපළ අයථා පරිහරණය යන චෝදනාව සඳහා තමා ඇතුළු 05 දෙනෙකුට දඩුවම් නියම වුවද, තමාට පමණක් දඩුවම් ලබාදීමට එරෙහිව තමා විසින් යොමු කළ අභියාචනය මාස 05 ක් ගත වනතෙක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පළවන වගඋත්තරකරු විසින් යොමු නොකල බවත්, නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරිය විසින් යොමු කළ ලිපිය සඳහා ද අවශ්‍ය ක්‍රියාමාර්ග නොගත් බවත්, කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා සනයට අයත් නිලධාරින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කර තිබියදී එම චක්‍රලේඛනය අනුව කටයුතු කිරීම ද පැහැර හැර ඇති බවත්, තම දුක්ගැනවිල්ල දැනුම්දීම සඳහා පළවන වගඋත්තරකරු හමු වූ සෑම අවස්ථාවකම එයට නිසි පිළිතුරු ලබානොදී බැණවැදීම් සිදුකළ බවත්, ඒ අනුව තමාගේ මූලික අයිතිවාසිකම් කඩ කිරීම වෙනුවෙන් වන්දි මුදලක් ලබාදෙන ලෙසත්ය.

තවද, තුන්වන වගඋත්තර පාර්ශවීය අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ වාර්තාව සඳහා ද පැමිණිලි පාර්ශවය විසින් 2020.09.28 දිනැතිව විරෝධතා ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙන් නිකුත් කල චක්‍රලේඛන අනුව කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බාණ්ඩ - 2 සේවා ගණය CMN – 1 – 2006 A නව බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වූ 2012.07.21 වන දිනට අදාළ තනතුරේ සේවයේ නියුක්ත නිලධාරින් කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණයන්ගෙන් නිදහස් කිරීම ආහාර නිරීක්ෂිකා, වාට්ටු ලිපිකරු, ගෘහ පාලිකා, රසායනාගාර සහායිකා යන තනතුරු සඳහා ද අදාළ වන බවත්, ඒ අනුව 2008 වර්ෂයේ සිට තමාට හිමි වැටුප් වර්ධක ලබාදෙන ලෙසත්ය.

කෙසේ වුවද, වගඋත්තර පාර්ශවය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් වාර්තාවන් හි අඩංගු කරුණු සඳහා පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු ප්‍රමාණවත් නොවූ බැවින්, ඒ පිළිබඳව පැමිණිලිකාරිය දැනුවත් කළ ද ප්‍රමාණවත් ලෙස කරුණු ඉදිරිපත් නොකිරීම මත HRC/AM/28/19/S/EM අංක දරණ පැමිණිල්ලේ විමර්ශන කටයුතු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත ප්‍රකාරව අවසන් කර ඇත.

**නිරීක්ෂණ :**

1. පැමිණිලිකාරිය වන කේ.ඩී.එම්.ආරියලතා පොඩිමැණිකේ යන අය දෙහිඅත්තකණ්ඩිය මූලික රෝහලේ ආහාර නිරීක්ෂිකාවක ලෙස සේවය කරමින් සිටියදී 2016.02.17 වන දින රෝහලේ වෛද්‍ය අධිකාරි විසින් සිදුකරන ලද හදිසි පරීක්ෂාවකදී මුලුතැන්ගෙයි අමු ආහාර ද්‍රව්‍ය මුලුතැන්ගෙයි සේවය කරන සේවකයින්ගේ විවේක කාමරයේ යම් යම් ස්ථාන වල තිබියදී සොයාගැනීම හේතුවෙන් පැමිණිලිකාරිය ඇතුළු මුලුතැන්ගෙයි සේවය කරන පස් දෙනෙකුට චෝදනා එල්ල කර ඇති බව නිරීක්ෂණය වේ.

2. ඉහත චෝදනාවට ලක්වූ පස් දෙනාගෙන් එක් අයෙකු වන ජේ.බාලමහත්මයා නැමති අයගේ අත් බෑගයේ තිබී අමු ආහාර ද්‍රව්‍ය හමුවී තිබියදී ද ඔහුව පරීක්ෂණ වලින් ඉවත් කර අනෙක් හතර දෙනා සම්බන්ධව පමණක් පරීක්ෂණ කටයුතු සිදුකර, 2017.03.15 දිනැතිව පළාත් සෞඛ්‍ය ලේකම් විසින් පැමිණිලිකාරියට පමණක් දඩුවම් ලබාදීම සිදුකර වසරක වැටුප් වර්ධක අත්හිටුවා පදියතලාව ප්‍රාදේශීය රෝහල වෙත ස්ථාන මාරු කර ඇති අතර, නමුත් චෝදනාවට ලක් වූ එස්.එම්.ප්‍රේමලතා නැමති අයට උසස්වීම් දෙකක් සමඟ වැටුප් වර්ධක ලබාදී ස්ථාන මාරුව ද අවලංගු කර ඇති බව නිරීක්ෂණය වේ.

3. පසුව පදියතලාව ප්‍රාදේශීය රෝහලේ වෛද්‍ය අධිකාරි විසින් විනය හේතු මත ස්ථාන මාරු ලබා පැමිණ රෝහලේ සේවය කරනු ලබන පැමිණිලිකාරිය වන ආරියලතා පොඩිමැණිකේ මහත්මිය රෝහලෙන් නිදහස් කල හැකි බවට නිකුත් කළ 2020.01.27 දිනැති ලිපිය නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරිය වෙත පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳව සලකා බලා විශ්‍රාම යාමට ආසන්න වයසේ පසුවන ඇයට නැවත දෙහිඅත්තකණ්ඩිය මූලික රෝහල වෙත ස්ථාන මාරු ලබාදී ඇති බව නිරීක්ෂණය වේ.

4. එසේ ස්ථාන මාරු ලබා 2020.07.31 දින සේවයට වාර්තා කිරීමේදී එම රෝහලේ රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය විසින්, පැමිණිලිකාරිය වන ආරියලතා පොඩිමැණිකේ යන අයව එම රෝහලේ තබා ගතහොත් වෘත්තිය ක්‍රියාමාර්ගයකට එළඹෙන බව දන්වමින් එම රෝහලේ වෛද්‍ය අධිකාරි වෙත කරන ලද ලිඛිත දැනුම්දීම අනුව වෛද්‍ය අධිකාරි විසින් ඒ බව අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත දන්වා ඇති අතර, ඒ අනුව අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ 2020.08.07 දිනැති ලිපිය මගින් ඇයව නැවත පදියතලාව ප්‍රාදේශීය රෝහල වෙත ස්ථාන මාරු කරන ලෙස දෙහිඅත්තකණ්ඩිය මූලික රෝහලේ වෛද්‍ය අධිකාරි වෙත දන්වා ඇති බව නිරීක්ෂණය වේ.

5. පැමිණිලිකාරිය වෙත ලබාදී ඇති දඩුවම් ස්ථාන මාරුව 2017 වර්ෂයේදී සිදුකර ඇති අතර, ඇය විසින් නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරිය වෙත අභියාචනය ඉදිරිපත් කර ඇත්තේ 2020 වර්ෂයේදී වන අතර, ඒ අනුව දඩුවම් ස්ථාන මාරුව සිදු කර වසර 03 කට පසුව පැමිණිලි පාර්ශවය විසින් එම අභියාචනය සිදුකර ඇති බවත්, මේ වනවිට ඇය විශ්‍රාම යාමට ආසන්න වයසේ පසුවන බවත් නිරීක්ෂණය වේ.

6. තවද, ස්ථාන මාරුව නැවත දෙහිඅත්තකණ්ඩිය රෝහල වෙත ලබා නොදීම මත පැමිණිලිකාරිය මේවනවිට විශ්‍රාමය ඉල්ලා විශ්‍රාම ගොස් සිටින බවත් නිරීක්ෂණය වේ.

7. පැමිණිලිකාරියගේ අභියාචනය අනුව ආණ්ඩුකාරවරියගේ නියෝගය ප්‍රකාරව ලබාදුන් ස්ථාන මාරුව නැවත අවලංගු කිරීමට බලපාන ලද හේතුව වෛද්‍ය නිලධාරි සංගමයේ විරෝධතාවය බවත්, ඔවුන් විසින් වෘත්තිය ක්‍රියාමාර්ග ගන්නා බවට දැන්වීම අනුව පැමිණිලිකාරියගේ අභියාචන ස්ථාන මාරුව නැවත අවලංගු කර ඇති බවත් නිරීක්ෂණය වේ.

8. තවද, එය ආණ්ඩුකාරවරියගේ බලය ඉක්මවා කටයුතු කිරීමක් බව නිරීක්ෂණය වේ.

**නිගමනය :**

ඒ අනුව ඉහත කරුණු අධ්‍යයනය කිරීමේදී, වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ විරෝධතාවය පවතින තාක් කාලයක් පැමිණිලිකාරියට දෙහිඅත්තකණ්ඩිය රෝහලේ සේවය කිරීමට අවස්ථාවක් නොලැබෙන අතර, මෙම තත්ත්වය වෘත්තීය අයිතීන් වෙනුවෙන් ක්‍රියාකරන අය තවත් කෙනෙකුගේ

වෘත්තීය අයිතිවාසිකම් වලට අභියෝග කිරීමක් වන අතර, වෛද්‍ය නිලධාරින්ගේ සංගමය පෙන්වා දෙන පරිදි පැමිණිලිකාරියගේ ක්‍රියාකලාපයෙන් රෝහලට අපකීර්තියක් ඇති වූයේ නම්, එය විනය පියවර ගැනීමට කාරණයක් වේ.

නමුත්, ආණ්ඩුකාරවරියගේ නියෝග මත ලබාදුන් ස්ථාන මාරුව නැවත අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් අවලංගු කිරීම තුළින් හා එකම චෝදනාවට ලක්වී එක් අයෙකු එම පරීක්ෂණ වලින් නිදහස් කිරීම හා ස්ථාන මාරු ලබාදුන් අනෙක් නිලධාරින් තිදෙනාගේ පමණක් ස්ථාන මාරුව නිවැරදි කිරීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් වගඋත්තර නිලධාරින් විසින් උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරමි.

**නිර්දේශය :**

පැමිණිලිකාරිය මේ වනවිට විශ්‍රාම ගොස් සිටින බැවින්, වගඋත්තර නිලධාරින් විසින් පැමිණිලිකාරිය වෙත රු. 10,000/- ක මුදලක් ගෙවිය යුතු බවට නිර්දේශ කරමි.

2022. 03. 20 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

ස/- සැ.යු. : අදාළ මුදල "මුදල් ඇණවුමක්" මඟින් පැමිණිලි පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

ස/-